වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# තනතුරු පුරප්පාඩුව

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ නියාමන, සංවර්ධන සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පවතින පහත දැක්වෙන තනතුරු පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් කාර්යශීලි, උද්යෝගිමත් හා විචක්ෂණශීලි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## නීති නිලධාරී තනතුර (II ශ්‍රේණිය) MM (1-1) - පුරප්පාඩු 01

### රැකියා පිරිවිතරය :

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අවශ්‍යතාවය අනුව සියලුම නෛතික කටයුතු ඉටුකිරීම හා මෙහෙයවීම නීතිමය කරුණු සම්බන්ධයෙන් කළමනාකාරිත්වයට අවශ්‍ය උපදෙස් ලබා දීම සහ එම කටයුතු වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව සමඟ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු ඉටුකිරීම.

### අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

**බාහිර අයදුම්කරුවන්**

- ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම සහ වසර 03ක නීති ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම.
- නීතිවේදී උපාධිය සමත් අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

### තෝරා ගැනීමේ ක්‍රමවේදය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

### තනතුරු සඳහා වැටුප් පරිමාණය :

**MM 1-1 : රු. 91,690/- 10 x රු. 2480 - 15 x රු. 3450 - රු. 168,240/- (මාසිකව)**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 උපලේඛන II අනුව ආරම්භක මාසික වැටුප් පියවර **රු. 81,710/-** හා රජයේ අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ. ඒ අනුව ආසන්න වශයෙන් **රු. 124,510/-** පමණ ආරම්භක මාසික දළ වැටුපක් හිමිවේ.

### වයස් සීමාව :

අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

### වෙනත්/පොදු ප්‍රතිලාභ :

- මණ්ඩලයේ දැනට පවතින නීතිරීතිවලට අනුකූලව වෛද්‍ය සහනාධාර පහසුකම් ලබාදෙනු ඇත.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔහුගේ/ඇයගේ වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සඳහා ගෙවිය යුතු අතර මණ්ඩලය ඒ සඳහා 15% කින් දායක වනු ඇත.
- මණ්ඩලය තවදුරටත් සේවා නියුක්ත භාර අරමුදලට ඔහුගේ/ඇයගේ වැටුපෙන් 3% කින් දායක වනු ඇත.

### පොදු කොන්දේසි :

- සියලු අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- සියලු අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා සෞඛ්‍ය තත්ත්වයකින් පරිපූර්ණ විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් මනා චරිතයකින් හෙබි පුද්ගලයින් විය යුතුය.
- තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයකට යටත්ව බඳවා ගනු ලබන අතර, තනතුරෙහි ස්ථිර කරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් වසරක පරීක්ෂණ කාලයකට යටත්ව පත්කිරීම සිදුකරනු ලැබේ.
- සියලු තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ පිහිටවනු ඇත. අභ්‍යන්තර අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වෙනි වගන්තිය යටතේ වැටුප් පිහිටුවීම සිදු කරනු ඇත.

### අයදුම් කිරීම :

රජයේ දෙපාර්තමේන්තු රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයද සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. මෙම කාර්යාලයෙන් හෝ **http:/www.srilankateaboard.lk** වෙබ් අඩවියෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රය පරිදි සකස් කරන ලද අයදුම්පත් උප්පැන්න සහතිකයේ සහ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමඟ **2026 ජුනි 23** වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලි.ප.තැ. එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා තේ මණ්ඩලය**
**574, ගාලු පාර,**
**කොළඹ 03.**